# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

# "ඇසිදිසි - ජනමාධ්‍ය" ශිෂ්‍යත්ව වැඩසටහන - 2026
## මාධ්‍යවේදී පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාර සැපයීම

**අරමුණ**

➤ ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම

**ඉලක්කගත කණ්ඩායම**

➤ වසර 02ක සේවා කාලයක් සපුරා ඇති හා අංක 2413/44 දරන 2024.12.05 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් වර්ගීකරණයට අයත් මාධ්‍යවේදියෙකු විය යුතුය.
**(https://www.news.lk/images/pdf/sinhala%20gazette.pdf)**

**තෝරා ගැනීමේ නිර්ණායක**

➤ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවන දිනය වන විට සඳහන් කර ඇති ආයතනවලින් ලබාදෙන මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආචාර්ය, දර්ශනපති, ශාස්ත්‍රපති, උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ඩිප්ලෝමා දිගුකාලීන හා කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා තෝරාගෙන තිබෙන හෝ දැනට පාඨමාලාවක් හදාරන හෝ අයෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී පාඨමාලාව සඳහා තෝරාගත් බවට හෝ එය හදාරන බවට හෝ අදාළ ආයතන විසින් නිකුත් කරනු ලැබූ ලිපි ඉදිරිපත් කළ යුතුය.)

➤ ඉල්ලුම් කරන පාඨමාලාව මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් විය යුතුය.

➤ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 18-55 අතර විය යුතුය.

➤ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ජනමාධ්‍යවේදීන් සඳහා 2025/2026 වර්ෂයට නිකුත් කළ මාධ්‍ය හැඳුනුම්පත ලබා තිබිය යුතුය.

➤ මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ඔස්සේ ප්‍රතිලාභ ලබා ඇති අයදුම්කරුවෙකු නැවත අයදුම්කරන්නේ නම්, එම පාඨමාලාව සාර්ථකව අවසන් කර තිබිය යුතුය.

**මූල්‍ය පහසුකම් ලබාදීම**

➤ පාඨමාලාව සඳහා ගෙවන ශිෂ්‍යත්ව මුදල - ආචාර්ය උපාධිය සඳහා රු. 700,000/-, දර්ශනපති, ශාස්ත්‍රපති හා සාමාන්‍ය උපාධිය වෙනුවෙන් උපරිම රු. 350,000/-, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ඩිප්ලෝමා, දිගුකාලීන හා කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලා සඳහා උපරිම රු. 200,000/-කි.

➤ ශිෂ්‍යත්ව සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්හට පාඨමාලා ගාස්තුවෙන් 50%ක් පාඨමාලාව ආරම්භයේදී පළමු වැනි වාරිකය ලෙසත්, ඉතිරියෙන් 25%ක් පාඨමාලාවේ දෙවැනි වාරිකය ලෙසත්, ඉතිරි 25% පාඨමාලාව සම්පූර්ණ කර සහතිකය ඉදිරිපත් කිරීමෙන් අනතුරුවත් ගෙවීම් සිදු කෙරේ.

**විෂය**

i. ජනසන්නිවේදය (Mass Communication)
ii. තාක්ෂණික විෂයන් (Technical subjects)
**උදා :** වීඩියෝ සංස්කරණය (Video Editing)
හඬපට නිෂ්පාදනය (Audio Production)
සමාජ මාධ්‍ය කළමනාකරණය (Social Media Management)
වෙබ් අන්තර්ගත නිර්මාණය (Web Content Creation)
බහුමාධ්‍ය නිෂ්පාදනය (Multimedia Production)
iii. දේශපාලන විද්‍යාව (Political Science)
iv. ආර්ථික විද්‍යාව (Economics)
v. සමාජ විද්‍යාව (Sociology)
vi. ජාත්‍යන්තර සබඳතා (International Relations)
vii. නීතිය (Law)
viii. ආපදා කළමනාකරණය (Disaster Management)
ix. අපරාධ විද්‍යාව (Criminology)
x. භාෂාව (Language) - සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පමණි
xi. දත්ත පුවත්පත්කලාව - Data Journalism

● මෙයට අමතරව මාධ්‍යයට සම්බන්ධ වෙනත් විෂයයක් ඉල්ලුම් කළහොත් ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව සලකා බැලේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

➤ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තේරීම් කමිටුවකින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ශිෂ්‍යත්වලාභීන් තෝරාගනු ඇත. තෝරා ගැනීමේ අවසාන තීරණය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

**අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

➤ පහත QR කේතය ස්කෑන් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ **www.media.gov.lk** වෙබ් අඩවියට සෘජුවම පිවිස එහි ඇති අයදුම්පත සම්පූර්ණ කර හෝ **අධ්‍යක්ෂ (මාධ්‍ය), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 163, 'ඇසිදිසි මැදුර', කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **"ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන 2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

➤ අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 10 දිනෙන් අවසන් වේ.

**සැලකිය යුතුය.**

➤ ශිෂ්‍යත්ව පිරිනැමීමෙන් අනතුරුව අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, අදාළ පාඨමාලාව උපරිම මාස 06ක් ඇතුළත ආරම්භ කළ යුතු වේ. නොඑසේ නම් ශිෂ්‍යත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

**විමසීම් : 0112-513645**
**චන්දන - 071-4931696 / මනෝජා - 076-4203645**
**වැඩි විස්තර : www.media.gov.lk**

**ලේකම්,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**